**ප්‍රවීණ මාධ්‍යවේදියකු මෙන්ම ප්‍රවීණ ලේඛකයකු ද වන ප්‍රේමකීර්ති රණතුංග මහතා මීට පෙර නවකතා ඇතුළු නිර්මාණාත්මක කෘති කිහිපයක්ම ලියා පළ කළ ලේඛකයෙකි. මුතු වසන්තය, දෝලි, අවසාන නින්දගම, මලබාර් නෑයෝ, පොල් මට්ටා, දේවක්කේඩුව, අතීතයේ දවසක, උප්පුතලම්, පිටමං කිරීම, පලවා හැරීම ඒ අතර කැපී පෙනෙන නවකතා කිහිපයක් පමණි. මේ කෘතිවලින් කිහිපයක්ම වයඹ පළාත් රාජ්‍ය සාහිත්‍ය සම්මානයෙන් පිදුම් ලබා ඇති අතර, ස්වර්ණ පුස්තක සම්මාන උළෙලේ දෙවැනි වටය ද නියෝජනය කර ඇත.**

**ප්‍රේමකීර්ති රණතුංග මහතාගේ නවතම නවකතාව 'කුණ්ඩලිය' නමින් දයාවංශ ජයකොඩි සහ සමාගමේ ප්‍රකාශනයක් ලෙස පසුගියදා නිකුත් කෙරිණි.**






# උසස් රසවින්දනයක් නැති සමාජය අයාලේ යනවා

## ප්‍රවීණ ලේඛක, ප්‍රවීණ මාධ්‍යවේදී ප්‍රේමකීර්ති රණතුංග

**• ඔබේ නවතම නවකතාව වන 'කුණ්ඩලිය' සඳහා ඔබට පසුබිම් වූ අත්දැකීම් කෙබඳුද?**

මේ කෘතිය මා රචනා කළේ පුස්කොළ පොත් සැකසීමෙන් ජීවත් වූ ශිල්පියකුට අලුතින් පැමිණි කඩදාසි පොත් හේතුවෙන් ඔහුගේ ජීවිකා වෘත්තිය අහිමිවීම පාදක කරගෙනයි. ඔහු සහ ඔහුගේ යැපෙන්නන් පාදක කරගෙනයි.

පුරාණ ලංකාවේ ලේඛන කලාව සිදුවුණේ පුස්කොළ පොත් අනුසාරයෙන්. තලගසේ ළපටි ඉරු තම්බා වියළා සකස් කර ගන්නා පත්ඉරු මත පන්හිඳෙන් අකුරු ලිවීම පුස්කොළ පොත් නමින් හැඳින්වුණා. අනුරාධපුර යුගයේ සිට පැවත ආ මෙම ලේඛන කලාව අවසන් වුණේ 1890 පමණ කාලයේ. මේ වනවිට බ්‍රිතාන්‍ය ජාතිකයන් තම මවු රටේ සිට මුද්‍රණ යන්ත්‍ර මෙරටට ගෙන්වීම ආරම්භ කොට තිබුණා. එමගින් කඩදාසිවල පොත් මුද්‍රණය කිරීම පටන් ගත්තා.

අච්චු අකුරෙන් කඩදාසියේ මුද්‍රිත පොත් රටපුරා බෙද හැරෙන්නට පටන් ගත්තේ මේ කාලයේ. එමගින් එතෙක් පුස්කොළ පොතේ පිටපත් කර විහාරස්ථාන වෙත පූජා කළ බණ දහම් පොත් ද කඩදාසියේ මුද්‍රණය කෙරුණු නිසා ධර්ම ග්‍රන්ථ පිටපත් කර පුස්කොල පොත් හද ජීවිකා වෘත්තිය සලසා ගත් විශාල පිරිසකට තම ජීවන මඟ ඇහිරී ගියා.

මුද්‍රිත පොත් භාවිතයට පැමිණීම සත් කෝරළයේ අලව්ව ප්‍රදේශයට විශේෂිත වන්නේ අලව්ව ආශ්‍රිත ගම්මාන කීපයකම පුස්කොළ පොත් සකසා රටපුරා බෙද හල පිරිසක් ජීවත්වීමයි. අලව්වට ආසන්න ගලතරය ගම ඉන් එකක්. එහි අදත් තල කොළවලින් වටාපත් නිර්මාණය කෙරෙනවා. පුස්කොළ පොත් ලේඛනයේදී ඡේදයක් හෝ පරිච්ඡේදයක් අවසන් කරන්නේ අද වගේ තිතක් තියලා නොවෙයි. ඒ සඳහා භාවිත වුණේ 'කුණ්ඩලිය' නමින් හැඳින්වූ සංකේතයක්. මෙය පුරාණ සිංහල භාෂාවේ නැවතීමේ තිත හැටියට සලකන්න පුළුවන්. පරිච්ඡේදයක් අවසන් කරන කුණ්ඩලිය හෙවත් සිංහල නැවතීමේ තිත වෙනුවට මුද්‍රණ යන්ත්‍රයේ තිබූ නැවතීමේ තිත තබා අවසන් කෙරුණේ පුස්කොළ ශිල්පීන්ගේ ජීවන ක්‍රමයයි. මා මේ නවකතාවට 'කුණ්ඩලිය' යන නම යෙදුවේ ඒ අදහසින්.

**• ඔබේ මීට පෙර නවකතා පරීක්ෂා කිරීමේ දී කැපී පෙනෙන කරුණක් වන්නේ ඒවායේ ඇති පර්යේෂණාත්මක ගුණයයි. ඔබ බොහෝ දෙනකුට හසු නොවූ පර්යේෂණ ඉසව් නවකතා සඳහා තේමාකොට ගැනීමේ විශේෂත්වය කුමක්ද?**

මම හිතන්නේ ඕනෑම කෙනකුගේ ජීවිත කතාව තුළ යම් කථාන්තරයක් තිබෙනවා. කෙනකුගේ යටගියාව තුළ කථාන්තරයක් සැඟවී තිබෙනවා. මම හිතන්නෙ නවකතා තේමාව ගැන අලුතින් හිතල අහඹුවක් ගැන ලියන්න වද වෙනවට වඩා අතීත මූලාශ්‍රයක් පදනම් කරගෙන ප්‍රතිනිර්මාණය කිරීම වැදගත් කියලා. එයින් අලුත් පරම්පරාවට එවැනි දෑ ගැන දැනගන්න අවස්ථාව ලැබෙනවා. ලංකාවේ පුස්කොළ පොත් ගැන කතා කළාට ඒවා නිෂ්පාදනය වුණේ කොහොමද නිර්මාණය කළේ කවුද ඔවුන් ජීවත් වුණේ කොහොමද කියන එක බොහෝ දෙනා දන්නේ නැහැ. ඔවුන් ගත් වෙහෙස පිළිබඳ දන්නේ නෑ. ඒ ගැන සොයා යාම ඇත්තෙන්ම පර්යේෂණාත්මක අත්දැකීමක්.

මේවගේ ක්ෂේත්‍ර ඕනෑ තරම් තිබෙනවා. ඒ බොහෝ ඒවා තවමත් ප්‍රාමාණිකව සාකච්ඡාවට නැගී නැහැ. ලේඛකයන්ට ඒ පිළිබඳව සොයා යාමටත් පර්යේෂණය කිරීමටත් ඒ තුළින් නව නිර්මාණ කිරීමටත් සැලසෙන අවස්ථාව නවකතාවට ඉතාමත් යහපත් පසුබිමක් සකසා දෙනවා.

**• නවකතාව යනු සත්‍යයේත් කල්පිතයේත් එකතුවක් ලෙස සැලකෙනවා. ඔබ යොදා ගන්නා අතීත මූලාශ්‍ර මතට පරිකල්පනය එකතු කිරීමේ දී භාවිත කරන උපක්‍රම මොනවාද?**

නවකතාව ලිවීමට පෙර පුස්කොළ පොත් සම්බන්ධයෙන් ලියැවුණු විස්තර බොහොමයක් මට කියවන්න අවස්ථාව ලැබුණා. ඒ හරහා මට බොහෝ අප්‍රකට තොරතුරු දැනගන්න පුළුවන් වුණා. ඒ ලැබුණු තොරතුරුවලට අනුව රජතුමාට පුස්කොළ සැපයූ රාජකීය තල උයන තිබුණේ අලව්වට නුදුරු ගලතරය නමැති ගමේ. දඹදෙණිය රජ මාලිගයට සැතපුම් තුනක් පමණ ඔබ්බෙන් පිහිටි පුස්කොළදෙණිය නමැති විහාරස්ථානයේ නැවතී ගලතරයෙන් ගෙන ගිය තල්පත් ඉරුවල රජතුමා පොත් ලියූ බව දඹදෙණි ජනප්‍රවාදවල සඳහන් වෙනවා.

ඒ වගේම ගලතරය ගමේ අදටත් සුවිශාල තල්ගස් යායක් දකින්න පුළුවන්. වළගම්බා රජුගේ කාලයේ මාතලේ අළුවිහාරයේ කරවන ලද ධර්ම සංගායනාව සඳහා තල්පත් ඉරු ගෙනයන ලද බව කියන්නෙත් ගලතරය ගමෙන්. මේ ගම හරහා යන එන සෑම විටම මට සිතුණේ මොවුන් පුස්කොළ පොත් සැකසීමට මොන තරම් මහන්සියක් ගන්න ඇතිද කියලයි. ඒ සිතිවිල්ල හරහා තමයි මම නවතාවට අවශ්‍ය පරිකල්පනය මතු කර ගන්නේ. ඔවුන් ගෙවූ ජීවිතය, මුද්‍රණ කර්මාන්තය පැමිණීමෙන් පසු ඔවුන් මුහුණ දුන් ප්‍රශ්න, ජීවිකාව ගෙවූ අන්දම නවකතාවකට යෝග්‍ය වන පරිදි සිතින් මවාගන්න මට සිදුවුණා.

**• නවකතාවක භාෂාව තීරණය විය යුත්තේ කතා තේමාවට කාලයට හා පරිසරයට ගැළපෙන අන්දමින්. ඓතිහාසික මූලාශ්‍ර සහිත නවකතාවක බස තීරණය කිරීමේදී කොහොමද මේ සඳහා සාධාරණය ඉටු කරන්නේ?**

මේ කතාවට අදළ වන පරිසරය හා කාලය මහ දිගු ඉතිහාසයක් කියා පාන්නේ නැති තරම්. ඒ කාලය සහ අද භාවිත වන භාෂාවත් එක්ක බලපුවාම ලොකු වෙනසකුත් නැති තරම්. ඒක ඒ තරම් සංකීර්ණ ලෙස ගතයුතු ප්‍රශ්නයක් කියල මම හිතන්නේ නෑ.

මාර්ටින් වික්‍රමසිංහ මහතා දුටුගැමුණු රජුගේ කාලය පදනම් කොට ගනිමින් ලියපු 'රෝහිණී' නවකතාවේදී භාවිතයට ගත්තෙ වර්තමාන භාෂාව. දුටුගැමුණු යුගයේ භාෂා ලක්ෂණ ඒ පොතේ නෑ. එහෙම වුණාය කියල නවකතාව අසාර්ථක යැයි තීරණය කරන්න බෑ. ඒ නිසා තේමාව කුමක් වුවත් කතුවරයා භාවිත කරන භාෂා උපක්‍රම අනුව තමයි කෘතිය සාර්ථක ද අසාර්ථක ද කියල තීරණය වෙන්නෙ.

**• දැන් පවත්නා සමාජ, ආර්ථික, දේශපාලන අර්බුදය තුළ පොත් කර්මාන්තයට කණ කොකා හඬමින් සිටින බව පෙනෙනවා. මේ තත්ත්වය මේ රටේ ලේඛකයන්ට, පාඨකයන්ට සහ පොදුවේ සාහිත්‍යයට කොහොම බලපායිද?**

මම හිතන්නෙ මේ වගේ ප්‍රශ්නයක් ඇතිවී තිබෙන වෙලාවක රජය මැදිහත් වෙන්න ඕනෑ. පුවත්පත්වලටත් පොත් පත් මුද්‍රණයටත් අවශ්‍ය කඩදායි හිඟකම ගැන අද ලොකු ප්‍රශ්නයක් තියෙනවා. ඒක ඇතිවී තිබෙන්නේ රජය ඒ සඳහා ඩොලර් ලබා නොදෙන නිසයි. හැබැයි රට ඇතුළෙ පොත්පත්වලට සහ පුවත්පත්වලට ඉල්ලුමක් තියෙනවා. ඒ ඉල්ලුමට සාධාරණයක් ලැබෙන්නෙ නෑ. රජයක වගකීම තියෙන්නේ මෙන්න මේ වගේ අවස්ථාවල.

පාඨකයාට හරවත් යමක් දෙන්න කඩදාසි නැත්නම් ලේඛකයන්, පාඨකයන් හඬක් නඟන්න ඕනෑ මේ වෙනුවෙන්. ජනතාවාදී රජයක් ලෙස වූවන්ට නමක් දිනාගන්න නම් ජනතාවගේ රසඥතාව දියුණු කරන කියැවීම වෙනුවෙන් මැදිහත් වෙන්න ඕනෑ. මේ මැදිහත් නොවීම තුළ පෙනෙන්නෙ රජයට සාහිත්‍යයට, කියැවීම අවශ්‍ය නෑ කියන එකයි. ලේඛකයොත් කීප දෙනෙක් හැරෙන්න මේ ගැන හඬ නගන බවක් පෙනෙන්නේ නෑ. මෙහෙම ගියොත් පොත් කියන එක සමාජයෙන් නැතිවෙලාම යයි.

**• එහෙම වුණොත් ඒ තත්ත්වය අපේ ඉදිරි සමාජයට කොහොම බලපායිද?**

හරවත් කියැවීමක් නැතිනම් ඒ සමාජය ලෙඩ වෙනවා. අපි පාසල් යන කාලෙ අපිට වැඩිපුරම කියවන්න ලැබුණෙ සෝවියට් පොතපත. ඒවා අඩු මුදලට ගන්න තිබුණා. සෝවියට් දේශය අපේ කියැවීමේ පිපාසය නිවාලන්නට ලොකු පොත් ප්‍රමාණයක් ලබා දුන්නා. 88-89 භීෂණයට හසුවූ බොහෝ පිරිසක් මේ පොතපත් කියැවූ අය. ඔවුන්ට බුද්ධිමත් කියැවීමක් තිබුණා.

ඒත් දැන් රජය කඩදායි සඳහා පහසුකම් සලසන්නෙ නැත්නම් ජනතාවගේ කියැවීම දියුණු වෙන්නෙ කොහොමද? දියුණු කියැවීමක් රසවින්දනයක් නැති මිනිසා අයාලේ යනවා. ඇතැම් විට ආණ්ඩුවලට අවශ්‍ය වෙන්නෙ කැරලි නවත්වන්න නොවෙයි කැරලි ඇතිකර ගන්න. එතකොට ඔවුන්ට තමන්ගේ ගමන මර්දනයෙන් යන්න පුළුවන්. ඒ නිසා මට නම් හිතෙන්නෙ සාහිත්‍යයට ආණ්ඩුව සහාය නොදෙන්නෙ හිතාමතාමයි.

දරුවන්ගේ පැත්තෙන් ගත්තොත් මවුපියන් දරුවන්ට කියැවීමට පොත්පත් රැගෙන දීමේ පුරුද්දක් තිබුණා. මේ යන හැටියට දරුවන්ට පොත්පත් රැගෙන දීම අසීරුවී තිබෙනවා. රජය තේරුම් ගන්න ඕනෑ මේ තත්ත්වය උඩ අනාගතයේ බිහිවන සමාජය මොකක්ද කියල. පොත්පත් කියවන දරුවා වෙනුවට දුරකතනයේ චැට් කරමින් කාලය කා දමන දරු පිරිසක් දැන් බිහිවෙමින් ඉන්නවා. රසවින්දනයක් නැති අයාලේ යන සමාජයක් පාලනය කිරීම ආණ්ඩුවලට ලේසියි. ඒ නිසා පොතපතින් ඈත්වුණ මේ රටේ තරුණ පරපුරට අනාගතයේ දුක්ඛිත ඉරණමකට මුහුණ දෙන්න සිදුවේවි.

සංවාද සටහන
**ගාමිණී කන්දේපොළ**